**<u>තරඟ උපදෙස්</u>**

- **උද්‍යානය තරුණ සමිතියේම නිර්මාණයක් විය යුතු අතර සාමාජිකයින් ක්‍රියාවලිය පුරාවට ක්‍රියාකාරීව සහභාගී වන බවට සහතික විය යුතුය.**

- **පරිසර හිතකාමී එනම්, ඉවත දමන ද්‍රව්‍ය / අදාල ප්‍රදේශයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය භාවිතා කිරීමට දිරිමත් කළ යුතුය. කරුණාකර ප්ලාස්ටික්, ඩිජිටල් බැනර්, සිමෙන්ති, කම්බි ආදිය භාවිතයෙන් වළකින්න.**

- **උද්‍යානය සැම කෙනෙකුටම පෙනෙන පරිදි දේවස්ථානයෙන් පිටත ප්‍රදර්ශනය කළ යුතුය. ඔබට එවැනි ඉඩක් නොමැති නම්, දේවස්ථානය තුළ කුඩා පරිමාණයේ උද්‍යානයක් ලෙස නිර්මාණය කළ හැකිය.**

<u>ප්‍රාදේශික කුලාචාර්‍ය පියතුමා සහ කමිටුවේ භූමිකාව</u>

- විධායක කමිටුව විසින් එවන ලද ලිපිය ප්‍රාදේශිකයේ තරුණ සමිති සමඟ බෙදා ගන්නා ලෙස දන්වා සිටිමු.

- ක්‍රියාත්මක කිරීමේදී, 2022 අප්‍රේල් 16 වන දින දක්වා සෑම සිකුරාදා දිනකම දහවල් 12ට පෙර, තරුණ සමිති සමඟ සොයා බැලීමට සහ ව්‍යාපෘති කණ්ඩායම යාවත්කාලීන කිරීම සිදු කළ යුතුය.

- **2022 අප්‍රේල් 16 සිට 17 යන දිනයන්හී**
    - 2022 අප්‍රේල් 16 - නිම කරන ලද උද්‍යානයේ ඡායාරූපය
    - 2022 අප්‍රේල් 17 - උද්‍යානය නිර්මාණය කිරීමට සම්බන්ධ වූ තරුණයින් සමඟ විවෘත උද්‍යානයේ ඡායාරූපය යොමු කිරීමට කටයුතු කළ යුතුය.
    - සියලුම ඡායාරූප විධායක කමිටු ව්‍යාපෘති කණ්ඩායම සමඟ බෙදා ගත යුතුය. (***බෙදා ගැනීමේදී ක්‍රමවේද නුදුරේදී දැනුම්දෙනු ඇත.***)

- 2022 අප්‍රේල් 10 වැනි දිනට පෙර උද්‍යාන ඇගයීමට ප්‍රාදේශික කුලාචාර්‍ය පියතුමා සහ කමිටුව, ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කළ යුතු අතර එම මණ්ඩලයේ තොරතුරු ව්‍යාපෘති කණ්ඩායමට සන්නිවේදනය කළ යුතුය.

- විනිශ්චය මණ්ඩලය සමඟ ඇගයීමේ නිර්ණායක බෙදා ගත යුතුය. (***ඇගයීම් කටයුතු සඳහා වන මාර්ගෝපදේශ සහ උපදෙස් ඔබ වෙත ලබා දෙනු ඇත.***)

- 2022 අප්‍රේල් 22 වන දින වන විට ප්‍රාදේශිකය තුළ ඇති හොඳම උද්‍යාන 03 තෝරාගෙන ව්‍යාපෘති කණ්ඩායම සමඟ ලිඛිතව සන්නිවේදනය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේදී තරුණ සමිති විසින් සිදුකිරීමට යුතු දෑ**

- තරඟ යාවත්කාලීන කිරීම් දැන ගැනීම සඳහා සෑම විටම දියෝකීසි වෙබ් අඩවිය / ලංකා සභා තරුණ ව්‍යාපාරයේ Facebook පිටුව වෙත පිවිසීමට කටයුතු කළ යුතුය.

- උද්‍යානය නිර්මාණය කිරීමට භාවිතා කරන සම්පත් / ද්‍රව්‍ය ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීම.

- සතිපතා (වඩාත් සුදුසු සෑම බ්‍රහස්පතින්දා දිනකම, 2022 අප්‍රේල් 16 දක්වා) දේවස්ථාන භාර පියතුමා හෝ තරුණ සමිති කමිටුව විසින් ප්‍රාදේශික කමිටුවේ විද්‍යුත් තැපෑල සමඟ අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීමේ ඡායාරූප බෙදා ගැනීම සිදු කිරීමට වග බලා ගත යුතුය.

- ව්‍යාපෘතියෙහි/උද්‍යානයෙහි නිමැවුම් අවසානයේදී සියලු කෝණ ආවරණය වන පරිදි (360° view) - ඇතුළත සහ පිටත) ඡායාරූප ගත කළ යුතු අතර මෙය 2022 අප්‍රේල් 16 (2022 අප්‍රේල් 17 දින පෙ:ව: 12.00ට පෙර ) පෙර සිදු කර ප්‍රාදේශික කමිටුව සමඟ බෙදා ගත යුතුය.

- විවෘත උද්‍යානයේ ඡායාරූප, උද්‍යානය නිර්මාණය කළ තරුණ තරුණියන් සමඟ 2022 අප්‍රේල් 17 (2022 අප්‍රේල් 18 වැනි දින පෙ.ව. 12.00ට පෙර) බෙදා ගත යුතුය. එමෙන්ම උද්‍යාන නිර්මාණයේ සියලු කෝණ ආවරණය වන පරිදි (360° view) සිදු කරන ලද විඩියෝවක්ද බෙදා ගත යුතුය.

**තවදුරටත් වැඩි විස්තර**

- ඇගයීම් කටයුතු සිදු කරන ආකාරය
- ඔබට ලැබෙන්නේ කුමක්ද?
- අවසන් තීරණය
- නිර්ණායක / මාර්ගෝපදේශ නුදුරේදී බෙදාගනු ලැබේ...,